# රාජ්‍ය සහ රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රය
# (Government and Public Administration Sector)

රජයේ සහ රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රයේ පුද්ගලයන් රාජ්‍ය ප්‍රතිපත්ති හා තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීමට දායක වේ. ඔබට ජාතික මට්ටමේ හෝ පළාත් පාලන ආයතනවල වැඩ කළ හැකි ය. ඔබට රජය තුළ පමණක් ඇති සමහර රැකියා ඇතුළු ව රජයේ ඕනෑම රැකියාවක් සොයා ගත හැකි වනු ඇත.

උදාහරණයක් ලෙස ඔබට ප්‍රාදේශීය ලේකම්වරයකු ලෙස, රාජ්‍ය පරිපාලන නිළධාරියකු ලෙස, විවාහ, මරණ හා උප්පැන්න සඳහා ලේඛන නිකුත් කිරීමේ රෙජිස්ටාර්වරයකු ලෙස, වාහන අදායම් බල පත්‍ර නිකුත් කරන්නකු ලෙස, නාගරික සංවර්ධන නිලධාරියකු ලෙස කටයුතු කළ හැකි ය.

**රාජ්‍ය සහ රාජ්‍ය පරිපාලන කේෂත්‍රය ආශ්‍රිත රැකියා/ වෘත්ති,**

**1. කෘෂිකර්ම පරික්ෂණ**
සෞඛ්‍ය සහ ආරක්ෂක නීතිවලට අනුකුල ව කෘෂිකාර්මික නිෂ්පාදන සහ උපකරණ පරික්ෂා කරන්නා.

**2. ජෛව තොරතුරු තාක්ෂණ ශිල්පී**
ජීව විද්‍යාත්මක දත්ත ගබඩා කිරිමට සහ විශ්ලේෂණය කිරිමට ජෛව තොරතුරු විද්‍යාඥයින්ට සහාය විම.

**3. නීති නිලධාරි**
යමක් පිළිගත් රජයේ නිති රෙගුලාසිවලට වලට අනුකුලද යන්න ඇගයිම.

**4. ඉදිකිරීම් සහ ගොඩනැගිලි පරික්ෂකවරු**
ඉදිකිරීම්වල සියලුම අදියරයන් පිළිගත් අවශ්‍යතා සපුරා ඇත්ද යන්න වග බලා ගැනිම සඳහා ව්‍යුහයන් පරික්ෂා කරන්නා.

**5. උසාවිය නාගරික සහ බලපත්‍ර ලිපිකරු**
අධිකරණවල හෝ රජයේ බලපත්‍ර ආයතනවල ලිපිකරු රාජකාරී ඉටු කරන්නා.

**6. ආපදා කලමනාකරණ නිළධාරී**
හදිසි අවස්ථා සමඟ කටයුතු කිරීම සඳහා සැලසුම් නිර්මාණය කිරීම සහ අධික්ෂණය කිරිම.

**7. මූල්‍ය පරීක්ෂක**
මූල්‍ය ආයතන පිළිගත් නීති හෝ රෙගුලාසි තුළ ක්‍රියාත්මක වන බවට වග බලා ගන්නා.

**8. නීති සම්පාදක**
නීති හඳුන්වාදීම හෝ නිර්මාණය කිරිම.

**9. වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ විශේෂඥ**
වැඩ පරිසරයන් ආරක්ෂිත සහ සෞඛ්‍ය සම්පන්න බව තහහවුරු කර ගැනීම සඳහා ඒවා විශ්ලේෂණය කරන්නා.

**10. වෘත්තිය සෞඛ්‍ය සහ ආරක්ෂිත කාර්මික ශිල්පී**
වැඩ පරිසර ආරක්ෂිත සහ සෞඛ්‍ය සම්පන්න බව තහවුරු කර ගැනීමට දත්ත රැස් කරන්නා.

**11. තැපැල් ස්ථානාධිපති/ තැපැල් අධිකාරී**
තැපැල් කාර්යාලවල පිරිපාලන කටයුතු සම්බන්ධිකරණය කරන්නා.

**12. නිශ්චල දේපල තක්සේරුකරු**
දේපළවල සාධාරණ වෙළඳපළ වටිනාකම ඇස්තමේන්තු කරන්නා.

**13. නියාමන කටයුතු විශේෂඥ**
විගණන සහ පරික්ෂණ ඇතුළු ව නියාමන ක්‍රියා පටිපාටි සම්බන්ධිකරණය කරන්නා.

**14. සංඛ්‍යාලේඛන සහායකයින්**
වාර්තා සඳහා සංඛ්‍යාන දත්ත සකස් කරන්නා.

**15. බදු පරික්ෂක සහ සකස් කරන්නා**
නීති හෝ රෙගුලාසිවලට අනුව පුද්ගලයන්ගේ හෝ සමාගම්වලින් බදු එකතු කරන්නා.

**16. ප්‍රවාහන පරික්ෂක**
භාණ්ඩ ආරක්ෂිතව ප්‍රවාහනය කරන බවට වග බලා ගැනීම.

**17. ප්‍රවාහන ආරක්ෂක පරීක්ෂක**
සංචාරකයින් ආරක්ෂිත ප්‍රවාහනය කරන බවට සහතික කර ගැනීමට මගීන්, ගමන් මලු හෝ භාණ්ඩ පරික්ෂා කරන්නා.

**19. නාගරික සහ ප්‍රාදේශිය සැලසුම්කරු**
ඉඩම් පරිහරණය කළ යුතු ආකාරය පිළිබඳ පුළුල් සැලසුම් සකස් කරන්නා.